# මිනිස් සිතේ ස්වභාවය පිළිබඳ බෞද්ධ මතය

මහාචාර්ය හෙන්රි වීරසිංහ.

## 1.0 පසුබිම

නිර්මාණවාදය (අදිසි දෙවියෙකු විසින් මිනිසාත් ලෝකයත් මැවූවේ ය යන මතය) මුළුමනින් ම බැහැර කරන බුදුදහම නිශ්චිත මනෝවිද්‍යාත්මක සිද්ධාන්ත මත පිහිටි උදාර මිනිස් හැසිරීමේ වැදගත්කම අවධාරණය කරන[1] චරණ ක්‍රියාවලියකි. ලෝකයේ පහළ වූ විවිධ ආගම් අතර මිනිස් චරණය ස්වභාවය ඔහුගේ සිතේ ස්වභාවය මත ම සිදුවන බව අවධාරණය කරයි. පිරිසිදුකම හෝ අපිරිසිදුකම, විමුක්තිය හෝ භෞතික හා ආධ්‍යාත්මික බැඳීම මිනිස් සිත හා සම්බන්ධ බවත්,[2] මිනිසාගේ මැවුම්කරු[3] මිනිසාම බවත් (මිනිසාගේ සිත බවත්) මූලික බුදුසමය මොනවට විවරණය කරයි. හොඳ හෝ නරක, යහපත හෝ අයහපත, කුසල හෝ අකුසල, පින හෝ පව මිනිස් සිත තුළින් ම මතුවන ක්‍රියා සන්තති අනුව නිගමනය වන බව පැහැදිළි ය. මූලික බුදුසමය විවරණය කරන අයුරු මිනිස් සිතේ ස්වභාවය පිළිබඳ බෞද්ධ මතය විමසා බැලීම මෙම ලිපියේ මූලික අරමුණ ය.

## 1.1 මිනිස් සිතේ ස්වභාවය

මුල් බුදුසමයෙහි (සූත්‍ර පිටකයෙහි) සිත හඳුන්වාදීම සඳහා සංකල්ප (වචන) තුනක් උපයෝගී කරගන්නා බව පෙනේ. (ඉතිපි චිත්තං, ඉතිපි මනො, ඉතිපි විඤ්ඤාණං S.11.95) සිත, මනස, විඤ්ඤාණය (අවදිබව) යනුවෙන් විවරණය වන මේ වචන තුනින් ම එක ම මූලික අදහසක් ප්‍රකට කරයි ද? නැතහොත් වෙනස් අදහස් තුනක් හඳුන්වා දෙන්නේ දැයි පරීක්ෂා කිරීම මිනිස් සිත පිළිබඳ ව බෞද්ධ මතයේ සමස්ත අර්ථය හඳුනා ගැනීමට උපකාරීවන බව සැළකිය යුතු ය.

පහත සඳහන් කරන ලද "අස්සුතම්තො සූත්‍රයෙහි "චිත්ත" "මනො" සහ විඤ්ඤාණ යන සංකල්ප තුනින් පොදු වශයෙන් සිත හඳුන්වන්නේ නමුදු (ඉතිපි චිතතං", ඉතිපි මනො ඉතිපි විඤ්ඤාණංග S11 - 92 මෙම වචන තුනෙහි සුවිශේෂ අර්ථ තුනක් ඇති බව පෙනේ. T.W.Rhys Devid පඬිතුමා ස්වකීය Pali-English Dictionary යන කෘතියෙහි මෙම ප්‍රභේදය පිළිබඳ ඉඟියක් දක්වයි. මෙම මතය සනාථ කරනු සඳහා මූලික බුදුසමයේ මූලාශ්‍රද විද්‍යාමාන බව අවධාරණය කළ හැකි ය. Rhys Davids පඬිතුමාට අනුව චිත්ත යනු සිතේ මූලික/ප්‍රකෘති අවස්ථාවයි. (P.266) නො පෙළඹුණු අවස්ථාවයි. මේ පිළිබඳ මූලික බුදු සමයෙහි මෙසේ සඳහන් වෙයි. "මෙම (මිනිස්) සිත අතිශයින් ම පැහැදිළි ය. නොහොත් පිරිසිදු ය. මෙම ප්‍රකෘති තත්වයේ පවතින සිත ආගන්තුක නොහොත් බැහැරින් පැමිණෙන කිළිටි කාරක සාධක වලින් කිළුටට පත්වේ."[4] තවත් අයුරකින් සඳහන් කරතොත් මිනිස් චිත්ත සන්තානයෙහි පහළවන පළමුවන සිත/නොහොත් පළමුවන සිතුවිළි ධාරාව අතිශයින් ම පිරිසිදු ය. ඒ සිත/සිතුවිල්ල අපිරිසිදු බවට පත්වන්නේ පසිඳුරන් ආශ්‍රය කරගෙන සිත කරා ගමන් කරන අරමුණුවල ස්වභාවය අනුව බව ප්‍රකට ව පෙනේ.

මනො (මනස) යනු සිත පිළිබඳ ව විවරණය වන දෙවන අවස්ථාව යි. රීස් ඩේවිඩ්ස් පඬිතුමාට අනුව මනෝ යනුවෙන් හැඳින්වෙන්නේ සිත පෙළඹුණු අවස්ථාව යි. (එම.520) පෙළෙඹුණු සිත සිතුවිලිවලට පෙරාතුව ගමන් කරයි. (මනො පුබ්බංගමා ධම්මා ධ.ප.1) මෙහි පෙළඹුණු සිත යනුවෙන් විවරණය වන්නේ කුමක්දැයි අතුරු ප්‍රශ්නයක් පැන නගියි. මූලික බුදු සමයට අනුව සිත නිරන්තරයෙන් ස්වයංක්‍රීය ප්‍රේරණ (Drive) ත්‍රයකින් පෙළෙඹෙමින් පවතියි. 1.ලෝභ (දැඩි ආශාව) 2. දොස-නෝසන්සුන්බව, ගැටීමේ නැඹුරුව සහ 3.මෝහ-අපහැදිළි බව, අවිනිශ්චිත බව ඒ ප්‍රේරණත්‍රයයි. මෙම ස්වයංක්‍රීය ප්‍රේරණත්‍රය විසින් නිරන්තරයෙන් ම පුහුදුන් සිත පෙළඹ වේ.

මූලික බුදු සමය විවරණය කරන මෙම ප්‍රේරණත්‍රය පණගන්වනු සඳහා මනෝමය ආහාර සැපයෙන්නේ ඉන්ද්‍රියයන් පහ මගිනි. ඇස්, කන්, දිව, නාහය සහ ශරීරය යනු ඒ ඉන්ද්‍රියයන්



පඤ්චකයයි. එම ඉන්ද්‍රියයන් පඤ්චකය පවතින්නේත් නිබඳව මෙනෙහි කරන පැරණි අත්දැකීම් පදනම් කොට ගලා එන සිතුවිළි පරිකල්පනය නිසා මතුවන සිතුවිලි සහ සිතතුළ නිබඳ ව නලියනු ලබන විවිධ ආකාරයේ සිතුවිළි ද සිතට ආහාර ලබා දෙන තවත් මඟකි. මෙම මාධ්‍යය "**මනොසංචෙතනිකාහාර**" යනුවෙන් බෞද්ධ මූලාශ්‍රවල සඳහන් වේ. සිත දැඩිලෙස අවධානයක, ඉලක්කයක, අරමුණක බඳවා තැබීම සඳහා මූලික ව ක්‍රියාකරන අවදිබව (විඤ්ඤණාහාර) යනුවෙන් මූලික බුදු සමයේ එයි.[5]

සිත තුළ පවතින ප්‍රේරණ ත්‍රයය ක්‍රියා කරන්නේ සිත උත්තේජනය කරවනු ලබන ආහාර මගිනි. එම ආහාර කෙරේ සිත තුළ අභිරුචිය උපදවන්නේ සිත තුළ නිබඳ ව විසිරි පැති පවතින ආශාව කේන්ද්‍රකරගන බව මුල් බුදු සමය සනාථ කරයි. තණ්හාව යනුවෙන් මුල් බුදු සමයේ විවරණය වන්නේ සිත උත්තේජනය කරවීමට කාරකය වන හේතුව වේ. තණ්හාව මිනිස් සිත සැපයට මෙන් ම දුකටත් නිදහසට මෙන් ම දිගුකාලීන බැඳීමටත්, සන්සුන්කමට මෙන් ම නොසන්සුන්කමටත් හේතුව මූලික කාරකය බව මුල් බුදු සමය මොනවට විවරණය කරයි. එක අතකින් සළකන කල වාහනයක ඇන්ජිම පණගන්වනු සඳහා යොදා ගන්නා ලබන බැටරිය නොහොත් විදුලි කිරණ මූලාශ්‍රය හා සමවන තණ්හාව මිනිස් සිත පණගැන්වීමටත් ක්‍රියාකරවීමටත් ඉදිරියට පවත්වා ගෙන යෑමටත් ආධාර වේ.

> "ඒ තණ්හාව වූ කලී නැවත ඉපදීමට තුඩුදෙන සසර ඇල්ම ඇතිකිරීමට නොහොත් බැඳ තැබීමට කාරකවන්නා වූ පසිඳුරන් කෙරේ ඇල්මටත් යළි ඉපදීමට නැඹුරුඳුන්නා වූත් සසර ගමන නැවතීමටත් හේතු වන්නකි."[6]

## 1.2 මානසික හැකියා හතරක්

තණ්හාව මාධ්‍ය කොට ප්‍රේරණ පණගැන්වෙන බවත්, උත්තේජිත ප්‍රේරණ විසින් සිත විවිධ ආකාරයෙන් මෙහෙයවනු ලබන බවත් (චිත්තෙන නීයති ලොකෝ) පැහැදිළි ය. පණගැන්වුණු සිත බාහිර පරිසරය සමඟ සම්බන්ධකම් පැවැත්වෙයි. එම ක්‍රියාවළිය සිදු කෙරෙන්නේ සිත තුළ සහජයෙන් පිහිටි මානසික කුසලතා **හතරක ආධාරයෙනි**. සර්ව සාධාරණ වූ මෙම මානසික

කුසලතාවල යම්බඳු ගුණාත්මක් හා ප්‍රමාණාත්මක වෙනසක් වේ නම් ඒවා පුද්ගල බද්ධ බව මූලික බුදු සමය සනාථ කරයි. එක් එක් පුද්ගලයාගේ (සම්මුති සත්වයාගේ) හටගැනීම පැවැත්ම හා අවසානය ඒ ඒ පුද්ගලයාගේ අතීත, වර්තමාන හා අනාගත ක්‍රියාවල ක්‍රියා රැස්කිරීමේ සවභාවය මත රඳා පවතියි. එසේ ම එක් එක් පුද්ගලයාගේ මානසික කුසලතාවල ස්වභාවය ද ඒ ඒ පුද්ගලයාගේ අතීත, වර්තමාන හා අනාගත ක්‍රියාවල ක්‍රියා රැස්කිරීමේ සවභාවය මත රඳා පවතියි. එසේ ම එක් එක් පුද්ගලයාගේ මානසික කුසලතාවල ස්වභාවය ද ඒ ඒ පුද්ගලයාගේ ම බලපෑම මතම (අතතාහි අත්තනො නාථො. ධ.ප) ක්‍රියාත්මක වෙයි.

මිනිස් සිත සිසාරා පවතින මානසික හැකියාවන් බුදු දහම හඳුන්වන්නේ **සංවේදන හැකියාව** (වේදනා) යනුවෙනි. දුක, සැප, දුක හෝ සැප නො වන තත්වය සිත හඳුනා ගත්තේත් අවබෝධ කරගන්නේත් සංවේදන මානසික හැකියාව (Sensation) මගිනි. මනෝවිද්‍යාව සංවේදනය (Sensation) යනුවෙන් හඳුන්වන්නේද බුදුදහම විවරණය කරන 'වේදනාව සංකල්පයට' බව පැහැදිළිය. බාහිර ආයතන නොහොත් ඇස්, කන්, දිව, නාසය, ශරීරය යන ඉන්ද්‍රිය පංචකය විසින් බාහිර පරිසරය හා සම්බන්ධකම් පවත්වමින් සිතේ පැවැත්මට ආධාරෝපකාර කරන බව දැන් පැහැදිළි ය.

මූලික බුදුසමයෙහි එන 'සඤ්ඤා, ඛන්ධ' (තෙවන ස්කන්ධය) බෞද්ධ මනෝවිද්‍යාව සංජානන මානසික හැකියාව යනුවෙන් හඳුන්වයි. උස, මිටි, රතු, කළු ආදී වර්ණ මෙන් ම තද ගතිය, සැර පරුෂ ගති ආදී කුදුමහත් භෞතික හා මනෝමය තත් ව තෝරා බේරා හඳුනා ගැනීමේ හැකියාව **සංජානන මානසික කුසලතාව** තුළ ගැබ්ව පවතී. මිනිසාට අභ්‍යන්තර මෙන් ම බාහිර බාධක, කරදර, ගැටළු, දුෂ්කරතා මැඩ ගෙන ජීවත්වීම සඳහා මෙම මානසික කුසලතාව උපකාරී වේ.

සංඛාර යනු කුසල් අකුසල් කිරීමේ මානසික හැකියාවයි. මෙය මිනිසා සතු තුන්වන මානසික හැකියාව ලෙස බෞද්ධ මනෝවිද්‍යාව හඳුන්වා දෙයි. මිනිස් සිත නිබඳ ව විවිධ අරමුණු



ගනිමින් පවතියි. ඒ විවිධ අරමුණු පසුපස ලුහුබඳින සිත විවිධ ක්‍රියා රැස් කරයි. හොඳ මෙන් ම නරක ක්‍රියා ද යහපත් මෙන්ම අයහපත් ක්‍රියා ද කුසල් මෙන් ම අකුසල් ක්‍රියා ද සම්පාදනය කරන්නේ සිත ය. ක්‍රියාවක නිෂ්පාදනය හා ආරම්භය සිතම කේන්ද්‍ර කොට පවතින බව මූලික බුදුසමය තර්කානුකූලව විවරණය කර තිබේ.

> 'මහණෙනි චේතනාවට (සිත තුළින් ම හටගන්නා සිතුවිල්ල) කර්මය යැයි කියමි. කයින් වචනයෙන් සහ මනසින් කම් රැස්කරන්නේ සිතින් සිතා ම යැයි අවධාරණය කරමි.' [7]

මිනිසාගේ හැසිරීම පිළිබඳ වූ සියළු ආකාරය සිත ම කේන්ද්‍ර කොට පවතින බව මෙයින් සනාථ වේ.

අවදිව සිරුවෙන් සිටීමේ හැකියාව සිත තුළ නිසර්ගයෙන් ම පිහිටි තවත් ලක්ෂණයකි. **විඤ්ඤාණඛන්ධ** (අවදිබව පිළිබඳ වූ පෞරුෂය ලක්ෂණය) යනුවෙන් මූලික බුදු සමය හඳුන්වන්නේ මිනිස් සිත තුළ පවතින ඒ අවදි බව ය. පොළඹවන ලද සිතට දිඟුකාලීන ක්‍රියා සම්පාදනය මගින් විවිධ ආකාරයෙන් පළිගැනීමාදී බිහිසුණු ක්‍රියාවල නිරතවන ආකාරයෙන් ඔප්පු වේ. එසේ ම යහපතට පෙළඹුණු සිත දිගුකාලීන ව යහපත් ක්‍රියාවල යෙදෙන ආකාරයෙන් ද සනාථ වේ. අප සමාජයේ වසන ඇතැම් අය ලාභ සත්කාර සිලෝක සම්මාන කිසිවක් අපේක්ෂා නො කොට බොහෝ සමාජ ශුභ සාධක වැඩවල යෙදෙන ආකාරය කලාතුරකින් නමුදු දැකිය හැකි වේ. අනාථපිණ්ඩික මහා උපාසක තුමා වැනි උසස් ගණයේ අවංක දානපතියන්ගෙන් නූතන සමාජය වුවද සම්පූර්ණයෙන් ම හිස් නොවන බව පිළිගත යුත්තකි. මේ අනුව අවදිය යනු සිත තුළ නිසර්ගයෙන් ම ගැබ්ව ඇති හොඳ හෝ නරක ක්‍රියා කෙරේ අවධානය යොමු කරවිය හැකි මානසික හැකියාව බව දැන් පැහැදිළි ය. මේ අනුව සළකන විට මිනිස් සිත සිව්වැදෑරුම් මානසික කුසලතාවකින් සකස් වූවක් බව බෞද්ධ මනෝවිද්‍යාවෙන් පැහැදිළි වේ.

## 1.3 සිත මනෝභාව උල්පතකි.

තණ්හාවට දාස වී නොහොත් තණ්හාවේ ඒකායන බලපෑමට හසුව සිත ක්‍රියා කරන ආකාරය මුල් බුදු සමය විවරණය කරයි. තණ්හාව විසින් උත්තේජනය කොට ලෝභය දෝසය සහ මෝහය යන ප්‍රේරණ විසින් මෙහෙයවන මිනිස් සිත මරු වසහයට පත්වූවක් යැයි බුදු දහම අවධාරණය කරයි. මූලික බුදු සමයේ සූත්‍රවල සඳහන් වන මාරධෙය්‍ය (ධ.ප) මාරා පාස(ස.නි) මාර (සු.නි.429) සහ නමුචි (සු.නි425) සංකල්ප වලින් අවධාරණය වන්නේ තණ්හාවේ ග්‍රහණයට හසුවූ සිතේ ස්වභාවයයි. තණ්හාවේ ග්‍රහණයට යටපත් වූ සිත මිනිසාගේ විමුක්තියට බාධාවකි. පැහැදිලි චින්තනයට, පැහැදිලි දර්ශනයට පැහැදිලි සත්‍යාක්ෂණයට අඛණ්ඩ අවධානය පවත්වාගන යාමට දැවැන්ත බාදකයකි. මේ බව අපූරු අයුරු මුල් බුදු සමයේ එන පාඨයක මෙසේ සඳහන් වෙයි.

**මාර** "ඒ මම (සිදුහත් තවුසා) නේරංජනා නදී තීරයෙහි බුදු බව පතා වීරිය වඩමින් සිටියෙමි. එවිට මාරයා (නමුචි) කරුණාබර වදන් කියමින් මා වෙතට ආයේ ය. අවුත් මා මගේ උත්සාහයෙන් වලකන්නට තැත්කළේ මෙසේය" මහතාණෙනි, ඔබ දැන් අතිශයින් ම දුබල වී ඇත. දුර්වර්ණ වී ඇත. මේ ආකාරයට වීරිය වැඩුවොත් ඔබේ මරණය අතලඟය. ඔය උත්සාහය අතහරින්න. ජීවත්වෙමින් එය කළ හැකියි.

**බුදුරදුන්**: එම්බල මාරය, "ඔබ දසවිධ අකටයුතු වලින් දසවිධ මාර සෙනගකින් සමන්විත වූ මිනිසා අවැඩට පොළඹවන පහත් බලවේගයකි. ඔබේ දස වැදෑරුම් මනෝමය බලකාය මෙසේ ය. 1.කාමය 2.නොකමැත්ත 3. සාගින්න හා පිපාසය 4.තණ්හාව 5.ථීන මිද්ධ 6.බිය 7.සැකය 8.ගුණමකුබව හා තදගතිය 9.ලාභය සිලෝක සත්කාර සහ වැරදි ලෙස ලබන යසස 10.තමා පැසසුම හා අනුන් හෙලා දැකීම" [8]

සුත්තනිපාතයේ ප්‍රධාන සූත්‍රයේ සඳහන්වන මෙම පාඨයේ මිනිස් සිත කෙරේ ස්වයංක්‍රීයව බලපාන මනෝභාව දසයක ස්වභාවය ප්‍රකට කරයි. තණ්හාව කේන්ද්‍ර කොට ගත් සිත නිරන්තරයෙන් සංකීර්ණ අරමුණුවල ග්‍රහණයට හසුව හැසිරෙන



ආකාරය මෙයින් විවරණය වෙයි. නන්වැදෑරුම් අරමුණුවලට හසුවන සිත තුළ නිරන්තරයෙන් ම පහල වන මනෝභාව නිසා සිත නො සන්සුන් තත්ත්වයේ පවතින බව මෙම සූත්‍රයෙන් මොනවට පැහැදිලි වේ.

විවිධ අගෝචර අරමුණුවල ග්‍රහණයට හසුවන සිත අසහනය සහ අනවදානය දැඩිකරවන මනෝභාව පහල කරවීමට පහස් ගොදුරු බිමක් වන ආකාරය වත්ථූපම සූත්‍රය අනාවරණය කරයි. දහසය වැදෑරුම් වී අගෝචර මනෝභාව (emotions) මිනිස් සිත නොසන්සුන් බවටත් රෞද්‍ර බවටත් පත්කරවමින් තමාටත් සමාජයටත් අයහපත පිණිස හැසිරෙන ආකාරය ප්‍රකට කරයි. ඒ දහසය වැදෑරුම් මනෝභාව මෙසේ ලැයිස්තුවක් ලෙස ප්‍රස්තාර කොට දැක්විය හැකි ය.

| | |
|---|---|
| 1. අභිජ්ඣා | දැඩිලෝභය |
| 2. ව්‍යාපාද | කෝපය |
| 3. උපනාහො | දැඩි කෝපය |
| 4. මක්ඛො | ගුණමකුකම |
| 5. පලාසො | බද්ධ වෛරය |
| 6. ඉස්සා | ඊර්ෂ්‍යාව |
| 7. මච්ඡරියං | මසුරුකම |
| 8. මායා | වාටුබව |
| 9. සාඨෙය්‍ය | කපටිබව |
| 10.ථම්භො | තදගතිය |
| 11.මානො | මානය |
| 12.අතිමානො | දැඩි මානය |

| | |
|---|---|
| 13.මදො | මත්වීම |
| 14.පමාදො | ප්‍රමාදය |
| 15.කොධො | ක්‍රෝධය |
| 16.සාරම්භො | දැඩි කෝපය |

වත්‍ථූපම සූත්‍රයේ සඳහන්වන මෙම මනෝභාව 16 (චිත්තවේග) තණ්හාව විසින් උත්තේජනය කරන ලද සිතක සාමාන්‍ය ස්වභාවය හෙළි පෙහෙළි කරයි. විවිධ අගෝචර අරමුණුවල දැවටෙන සිත නො සන්සුන්තාවටත් ඒ නිසා අසහනයටත් පත්වන ආකාරය මෙම මනෝභාව ප්‍රකට කරන මූලික පණිවිඩය බව දැන් පැහැදිළි ය.

මිනිස් සිත තිබඳව පෙළනු ලබන මනෝභාව වල ස්වභාවය මුල් බුදුසමයේ එන **ඔඝ** සංකල්පයෙන් ද මොනවට විවරණය කරයි. පාලි භාෂාවෙහි ඔඝ ශබ්දය ව්‍යවහාර කරන්නේ සැඩපහර යන අර්ථයෙනි. සිත තිබඳ ව සිසාරා සිටින අරමුණු විවිධ මනෝභාව උත්පාදනය කරවයි. ඒ මනෝභාව සැඩ පහරවල් ලෙස මුල් බුදු සමය දක්වන්නේ මිනිස් චරියාව කෙරේ ඒවා අසීමිත ව බලපාන හෙයිනි. ධම්ම පදයෙහි (47 ගාථාව) මනොභාව මහ සැඩ පහරවල් වලට සම කරයි. නිදිගත් යමක් මහා සැඩ පහරකින් ගසාගෙන යන්නාක් මෙන් දැවන්ත මනෝභාවයකට හසුවන පුද්ගලයා ද බලාපොරොත්තු ඉටුකරගැනීමටත් පෙරාතුව මරු වසහයට - දැවැන්ත මනෝභාවයක ගොදුරට හසුවේ යැයි අවධාරණය කොට තිබේ.[9]

මූලික බුදුසමය මිනිස් සිත ඇද තබන ප්‍රබල මනොමය **සැඩ පහර (ඔඝ) සතරක්** අනාවරණය කරයි. (1)කාම ඔඝ (පස්කම් සැපත කෙරේ නැඹුරු කරවන මනෝභාව සරාගී බව) (2)භවොඝ (යළි යළිත් සසර ඉපදීම කෙරේ සිත යොමුකරවන මනොභාව (3) දිට්ඨි ඔඝ (සිත විවිධ දෘෂ්ඨිජාල කෙරේ නැඹුරු කරවන මනෝභාව උදා: ශාස්වත, උච්ඡේද වැනි දෘෂ්ඨි) සහ 4 අවිජ්ජා ඔඝ (මිනිසා සහ සමාජය පිළිබඳ යථාර්ථය නො දැනීම



වසංකිරීම කෙරේ මිනිස් සිත අදින ලබන මනෝභාවය ඒ සතර වැදෑරුම් මනෝභාවයෝ වෙති. (අ.නි.11. 200) සුත්ත නිපාතයෙහි **ඔඝ** (මනෝභාව) යනු දැඩි ඇල්ම, දැඩි ලෙස ඇලීම, දැඩිලෙස ඇතිවෙන මානසික නැඹුරුව (ගෙධ-සු.නි.945) යැයි විවරණය කරයි. මෙම මනෝභාව සතර බලවත් ලෙස මිනිස් සිත පෙළන බැවින් මිනිස් සිත අසහනයට හා නොසන්සුන් බවට පත් කරන හෙයින්, මනෝමය සැඩ පහරවල් ලෙස විවරණය කරන බව දැන් පැහැදිළි ය.

මූලික බුදුසමයෙහි සඳහන්වන (අ.නි.11.211) **ආසව** සංකල්පය මිනිස් සිත තුළ අයහපත් මනෝභාව උත්පාදනය සඳහා හේතුවන මනෝමය කාරක හතරක් වශයෙන් ප්‍රභේද කොට දක්වයි. 1.කාම 2.භව 3.දිට්ඨි 4.අවිජ්ජා යනු ඒ සතරයි. ගලාඑන, නිරතුරුව හිත තුළට වැගිරෙමින් 'පවතින යන අදහසින් ඒ මනෝභාව කාරක හතර ආසව යැයි විවරණය කෙරේ. බොහෝවිට අතිශයින් ම පහත් සිතක් වුව ද මුරණ්ඩු කරවීමේ හැකියාවක් ඇති නිසා මේ ආසව මිනිස් සිත අයහපත කෙරේ නැඹුරුකරවන බවද අවධාරනය කොට තිබේ.

තණ්හාව පාදක කොට සිත තුළ මතුව විසිරි පැතිරී පවතින මනෝභාව දැඩි මුරණ්ඩු ස්වභාවයකින් මිනිස් සිත ග්‍රහණය කොට තිබෙන බව මුල් බුදුසමය පැහැදිළි කරයි. දැඩිලෙස විමුක්තියට පටහැනි **සිරමැදිරි දසයක** සිත රැඳවීමේ ප්‍රවණතාව මූලික බුදුසමය විවරණය කරන **දස සංයෝජන සංකල්පය** ප්‍රකට කරයි. එකතු කොට බැඳීමේ, බැඳතැබීමේ (සම්යොජේති) අදහසින් එම දස වැදෑරුම් බැමි සංයෝජන යැයි කියති. ඒ දසවිධ සංයෝජන නොහොත් දසවැදෑරුම් මනෝමය සිරමැදිරි මෙසේ ලැයිස්තුගත කොට දැක්විය හැකි ය.

1. සක්කාය දිට්ඨි - ආත්මයක් ඇත්තේය යන හැඟිම
2. විචිකිච්ඡා - සැකය - විශ්වාසය නොමැති බව පිළිබඳ මනෝභාවය
3. සීලබ්බත පරාමාසො - විවිධ ආගමික වතාවත්වල වැදගත්කම පිළිබඳ හැඟීම

4. කාමච්ඡන්දො - පස්කම් සැප පිළිබඳ නැඹුරුව

5. ව්‍යාපදො - කෝපය

6. රූපරාගො - රූපාවචර ලෝකවල ඉපදීමේ ආශාව

7. අරූපරාගො - අරූපාවචර ලෝකවල ඉපදීමේ ආශාව

8. මානො - මානය

9. උද්ධච්ඡං - උඩඟුබව

10 අවිජ්ජා - නොදත්කම

(අ.නි.1.231)

මෙම සංයෝජන දසය ඉතා විචාරවත් අයුරු විවරණය කලවිට ප්‍රකට වන්නේ තණ්හාව පාදක කොට සිත තුළ පැන නගින දැඩි සේ අයහපත කෙරේ මිනිස් පෞරුෂය යොමු කරවන ප්‍රබල මනෝභාව පද්ධතියක් බව ය. උදාහරණයක් වශයෙන් දක්වතොත් මිනිසාට නොමියෙන ආත්මයක් ඇත්තේය යන මානසික නැඹුරුවට (මනෝභාවයට) දැඩිසේ අනුයුක්ත වූ මිනිසාගේ චරණය (හැසිරීම) එම මනෝභාවය ක්‍රියාකරන ආකාරයෙන් ම සිදුවෙයි. ඔහුගේ කථාව සිතීම, හැසිරීම, ආදි සියළු ම ඉරියව් හා ගති පැවැතුම් නොනැසෙන ආත්මය පිළිබඳව ගත් මනෝභාවය අනුව සිදුවෙයි. එසේ ම මෙම දසවිධ මනෝභාව අතර පසිඳුරන් පිනවීම, ඉලක්ක කොට ගත් 'කාමච්ඡන්ද' මනෝ භාවය තුළ බැඳුණු සිතැති පුද්ගලයා ඔහු නිවසන පරිසරයේ විද්‍යාමාන විවිධ කාමුක වස්තු කෙරේ ලුහුබඳිමින් ලෞකික ප්‍රීතිය විඳින්නට තැත්කරන අකාරය තවත් උදාහරණයක් ලෙස දැක්විය හැකි ය. 'ඒඩ්ස්' වැනි භයානක සමාජ රෝග පැතිරෙන නූතන සමාජයේ කොපමණ පිරිස්



තාවකාලිකව ලැබෙන ලිංගික ආශ්වාදය සඳහා තම ජීවිතය පවා බිලිදෙන ආකාරය කදිම නිදසුනකි. මේ අනුව සෙසු 'සංයෝජන මනෝභාව' තුළ අන්තර්ගත අයස්කාන්ත බලවේගය ද දත හැකි ය.

මුල් බුදු සමය පිළිඹිඹු කරන 'පඤ්චනීවරණ සංකල්පය' ප්‍රබල මනෝභාව පහක් විවරණය කරන තවත් විග්‍රහයකි. සිත අවුරා සිටින්නේය, ඇත්ත ඇති සැටියෙන් දැකීමට උත්සුකවන සිත එම ප්‍රයත්නයෙන් වලක්වාලන්නේය යන අදහසින් ඒ මනෝභාව පහ නීවරණ යැයි හැඳින්වේ. මෙම මනෝභාව පහ තුළ ඉහත විවරණය කරන ලද ඇතැම් මනෝභාව ද අඩංගුව ඇති බව පෙනේ.

1. කාමච්ඡන්ද - පසිඳුරන් පිනවීම කෙරේ ,සිතේ නැඹුරුව

2. ව්‍යාපාද - පළිගැනීම කෙරේ සිතේ නැඹුරුව

3. ථීන මිද්ධ - අලසකම කෙරේ සිතේ නැඹුරුව

4. උද්ධච්ච කුක්කුච්ජ - උඩඟුකම කෙරේ සිතේ නැඹුරුව

5. විචිකිච්ඡා - සැකය කෙරේ සිතේ නැඹුරුව

(අ.නි.111.16)

මෙතෙක් විවරණය කරන ලද මනෝභාව ප්‍රභේද කිහිපයෙන් ප්‍රකටවන වැදගත් කරුණක් මෙහිදී මතුකොට දැක්වීම වැදගත් වේ. දැඩි කාම චේතනාව (කාමච්ඡන්ද, කාමරාග,) දැඩි කෝපය (අරති, ව්‍යාපාද) දැඩි සැකය (විචිකිච්ඡා) දැඩි උඩගු බව (මාන, උද්ධච්ච, කුක්කුච්ච) දැඩි ලෙස තමා උසස් කොට සැළකීම (මදො අත්තානං සමුක්කංසෙ - මානො) දැඩි ලෙස අනුන් හෙළා දැකීම (පරෙ අවජානති) ආදී ප්‍රබල මනෝභාව මිනිස් සිත තිබඳව පෙළමින් මිනිස් චරියාව කෙරේ අසීමිතව බලපාන බවයි. මෙවැනි ප්‍රබල මනෝභාවවල ග්‍රහණයට හසුවන මිනිස් පෞරුෂය හැසිරෙන ආකාරය කෙටියෙන් නමුදු පිරික්සීම වැදගත් ය.

## 1.4 මනෝභාව මිනිස් චරියාව කෙරේ බලපාන ආකාරය

අයහපත් චේතනා අයහපත් මනෝභාව උත්පාදනයට හේතුවන අතර යහපත් චේතනා යහපත් මනෝභාව උත්පාදනයට හේතු වේ. ලෝභය (දැඩි ආශාව) දොසය (දැඩි කෝපය) මොහය (දැඩි අපැහැදිලි බව නොදත්කම) මාධ්‍ය කොට සිත පහලවන මනෝභාව මිනිස් සිත දැඩිසේ අසහනයට පත්කරවන සුළුය. එසේ ම අලොභ(දැඩි ආශාවෙන් මිදීම) අදොස(දැඩි කෝපයෙන් මිදීම) අමොහ (දැඩි නුගත්කමින් මිදීම නිසා ඇතිවෙන නිවැරදි සංජානන කුසලතාව නිසා ඇතිවන මානසික වාතාවරණය) මිනිස් සිත පහත් බවටත් සන්සුන් බවටත් පමුණුවයි. ප්‍රකට හෝ අප්‍රකට මිනිස් චරියාවේ ගුණාත්මක හෝ ප්‍රමාණාත්මක ස්වභාවය සිත තුළ ක්‍රියාත්මක වන මනෝභාව වල ස්වභාවය අනුව ම නිගමනය වන බව බොහෝ බෞද්ධ මූලාශ්‍ර වලින් ඔප්පු වේ.

අයහපත් මනෝභාව මිනිස් චරියාව අයහපතට යොමු කරවන්නේ වැරදි මතවල රඳවාලීමෙනි. ඒ බව,

'සතුරෙක් සතුරෙකුට යම්බඳු නපුරක් කරයි ද ඊටත් වඩා නපුරක් නපුරු මනෝභාවයක විසින් වැරදි ආකාරයට ගමන් කරවන ලද සිත තමාට සිදු කරවයි.'[10]

අයහපත් මනෝභාව විසින් උත්තේජිත සිත අයහපත් ක්‍රියාවලට පෙළඹෙන බව සනාථ කරන ප්‍රායෝගික මූලධර්මයක් **දස අකුසල් සංකල්පය** ප්‍රකට කරයි. මිනිසා දස අකුසල්වල නිරත කරවන්නේ අයහපත් මනෝභාව විසින් සිත උත්තේජනය කරවූ විට ය. දස අකුසල් /දසවිධ කායික වාචසික සහ මනෝමය ක්‍රියා සපුරාලිය හැකි අයහපත් ඉදිරිපත් වීම ඇතිවන්නේ දැඩිලෙස සිත ඒ කෙරේ නැඹුරු වූ විට ය. දස අකුසල් නොහොත් දසවිධ අයහපත් චරියාව යනු සිත කය සහ වචනය දස ආකාර වූ වැරදි මගට යොමු කරවීම ය.



1. පරපණ නැසීම
2. සොරකම් කිරීම
3. වැරදි සහගත ලිංගික හැසිරීම
4. බොරු කීම
5. කේලාම් කීම
6. නපුරු ලෙස කථා කිරීම
7. නො වැදගත් ලෙස කථා කිරීම
8. දැඩි ලෝභ සහගත ලෙස හැසිරීම
9. කෝපයෙන් ක්‍රියා කිරීම
10. වැරදි මත පිළිගෙන ක්‍රියා කිරීම

අයහපත් මනෝභාව ලැගුම්ගත් සිතකට හැසිරිය හැකි දස ආකාරයක් මෙම දස අකුසල් සංකල්පයෙන් ප්‍රකට කරයි.

බුද්ධකාලීන භාරතයේ බුදුරදුන්ට පරම හතුරුකම් කළවුන් අතර දේවදත්ත හිමිට මූලික ස්ථානය හිමි වුයේ බුදුරදුන් කෙරේ ඔහු තුළ පිළිබිඹු වූ අයහපත් මනෝභාව ක්‍රියාකළ ආකාරය නිසා ය. බුදුරදුන් ඝාතනය කිරීමට තැත් කිරීම (ධ.ප.ක.12) සංඝ සමාජය භේද කරවීමට තැත් කිරීම (ධ.ප.ක.12) ආදිය දේවදත්ත තුළ ක්‍රියාත්මක වූ අයහපත් මනෝභාව ප්‍රකාශ කිරීමට තැත් කළ ආකාරය ප්‍රකට කරන අවස්ථා ය. නූතන සමාජයේ වුව ද මිනිස් සිත ක්‍රියා කරන ආකාරය මීට වෙනස් නො වේ. **බල තණ්හාව** (දේශපාලන, ආර්ථික, ජාතික, හා සංස්කෘතික වශයෙන් ප්‍රභේද කොට දැක්විය හැකි බල අති විශාල ය. **තත්ත්ව තණ්හාව** (දේශපාලන හෝ සමාජ තත්ත්වය) ලිංගික අවශ්‍යතා විසින් මෙහෙයවන ලද **කාම තණ්හාව** ආදී විවිධ හේතු නිසා උත්තේජිත මනෝභාව අතිභයානක අයුරු ප්‍රකට කරන අවස්ථා දුර්ලභ

නොවේ. මැතක විද්‍යාලංකාර සරසවියේ සිසුවෙක් එම උසස් ආයතනයේ ම ඉගැනුම ලැබූ සිසුවියක අමානුෂික ලෙස පිහිපාරවල් විසිපහක් ඇණ ඝාතන කිරීම ආදියෙන් ආදරය පිළිබඳ වූ මනෝභාවයක් පසුව බද්ධ වෛරයකට පරිවර්තනය වීමෙන් යැයි සිතිය හැකි ය. එසේ ම නූතන සමාජයේ ක්‍රියාත්මක වන දේශපාලන ක්‍රියාදාමය ද නිලතල දරන සුළු පිරිසකගේ බලතල ආරක්ෂා කරනු සඳහා සිදුකෙරෙන මිනිස් සංහාරය බලතණ්හාව විසින් මෙහෙයවන ලද මනෝභාවවල සියුම් ආකාරයේ ප්‍රකට වීම යැයි සිතීම යුක්ති යුක්ත ය. මේ අනුව අයහපතට නැඹුරුව ගොඩනැගුණු නපුරු මනෝභාව පරම සතුරෙකුටත් වඩා දරුණු බව පිළිගැනීම තර්කානුකූල ය.

මිනිස් චර්යාව මනෝභාව අනුව ම සිදුවන්නක් බව සනාථ කරනු සඳහා විද්‍යාමාන තොරතුරු බොහෝ ය. මිනිස් සිත සදහට ම නපුරු මනෝභාව වල ග්‍රහණයේ නො සිටියි. නපුරු මනෝභාව අනුව ම නො හැසිරෙයි. පරිසරය, අධ්‍යාපනය, දෙමාපිය බලපෑම, ගුරුවරුන්ගේ බලපෑම, පොත්පත් කියවීම, නිවැරදි ව සිතීමට පුරුදුවීම වැනි ප්‍රායෝගික ක්‍රියා නිසා මිනිස් සිත යහපත් මනෝභාව උත්පාදනය සඳහා තෝතැන්නක් විය හැකි ය. අයහපත් පරිසරය ඇසුර නිසා අයහපත් මනෝභාවයක ග්‍රහණයට පත්වී තම මව පවා ඝාතනය කරන්නට සමත් මනෝභාවයකට අවතීර්ණ වූ අංගුලිමාල බුදුරදුන් විසින් නිවැරදි මගපෙන්වීම නිසා රහත් තත්ත්වයට පත්වූ ආකාරය අපූරු සිද්ධියකි. (ම.නි.86) මානය විසින් මෙහෙයවන ලද නපුරු මනෝභාවයක සිරකරුවකු ව සිටි සච්චක බමුණා බුදුරදුන් සමඟ කළ විවෘත සාකච්ඡාවකින් නිවැරදි මගට යොමු වූ ආකාරය (ම.නි.35) අපූරුයි. මිනිස් චරියාව නිවැරදි මඟට යොමුවන්නේ ප්‍රබල උසස් මනෝභාවවල ඒකායන බලපෑම නිසා බැව් මේ කරුණු වලින් ඔප්පු වේ.[11] බුදුරදුන්ට දිවි ඇති තාක් ඉතා සමීපව ඇප උපස්ථාන කළ අනේපිඬු සිටුතුමාගේ චරිතය උසස් මනෝභාව විසින් සකස් කැරුණු උදාර මිනිස් චරියාවේ සංකේතයක් බව කාට වුව ද පිළිගත හැකි ය. (W'P'No'334 - Hellmuth Hecker. 1986)

අප ජීවත්වන නූතන සමාජයේ වුව ද යහපත්.මනෝභාවවල අසිරිමත් බලපෑමට හසු වූ තමාටත් පොදු සමාජයටත් අසීමිත අයුරු සේවයේ නියුතුවන පිරිස් කොතෙකුත් දැකිය හැකි බව පැහැදිළි ය. මිනිසා තුළ ජනිත ව ප්‍රබල ලෙස ක්‍රියා කරන හොඳ



හෝ නරක ම◌ෘනෝභාව වල උත්පාදනය සඳගා පරිසරය, අධ්‍යාපනය, සමාජ ඇසුර මෙන්ම තවත් අනේකවිධ හේතු හා සාධක බලපාන බව මේ අනුව නිගමනය කළ හැකි ය.

**පාදක සටහන්**

1. මා ජාතිං පුච්ඡ චරණං පුච්ඡ
කට්ඨාහවේ ජායති ජාතවේදො
නීචාකුලීනොපි මුනීධිතිමා
ආජානියො හොති හිරීනිසෙධො.

(සමු.නි.462)

2. අත්තනාව කතං පාපං අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං අත්තනාව විසුජ්ඣති
සුද්ධී අසුද්ධී පච්චත්තං නාඤ්ඤමඤ්ඤං විසොධයේ.

(ධ.පද.165 ගාථා)

3. මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනෝමයා
මනසා චෙ පදුට්ඨේන භාසතිවා කරොති වා
තතො නං දුක්ඛ මන්වේති - චක්කං ච වහතො පදං.

(ධ.ප.1සහ 2)

4. පභස්සරමිදං භික්ඛවෙ චිත්තං තංච ඛො ආගන්තුකෙහි
උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං

(අ.නි.12)

5. චත්තාරිමානි භික්ඛවේ ආහාරාණි කතමානි
චත්තාරි කබලිංකාරාහාරො ඵස්සාහාරො,
මනොසංචෙතනිකාහාරෝ විඤ්ඤාණාහාරොති.

(අ.නි.11.39)

6. යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා
තත්‍ර තත්‍රාභිනන්දිනී කාම තණ්හා භව තණ්හා
විභව තණ්හා (ස.නි.420)

7. චෙතනාහං භික්ඛවෙ කම්මං වදාමි
චෙතයිත්වා කම්මං කරොති කායෙන වාචාය මනසා

(අ.නි.1.105)

8. කාමා තෙ පඨමා සෙනා දුතියා අරති වුච්චති
තතියා ඛුප්පිපාසාතෙ චතුත්ථී තණ්හා පවුච්චති
පඤ්චමී ථිනමිද්ධං තෙ ඡට්ඨ අභිරූ පවුච්චති
සත්තමී විචිකිච්ඡා තෙ මක්ඛො ථම්භො තෙ අට්ඨමො
ලාභො සිලොකො සක්කාරෝ - මිච්ඡා ලද්ධොච යොයසො
යො චත්තානං සමුක්කංසෙ පරෙධ අවජානතී
එසා නමුචි තෙ සෙනා කන්හස්සාභිප්පහාරිනි
න තං අසූරොජිනාති - ජෙත්වා ච ලභතෙ සුඛො.

(සු.නි. 430-439)

9. පුප්ඵානිහෙව පචිනන්තං
ඛ්‍යාසත්ත මනසං නරං
සුත්තං ගාමං මහොසොච
මච්චු ආදාය ගච්ඡති

(ධ.ප.47)

10. දිසො දිසං යංතං කයිරා
වෙරිවා පන වෙරිනං
මිච්ඡා පනිහිතං චිත්තං
පාපියො නං තතො කරෙ.

(ධ.ප.42)

11. න තං මාතා පිතා කයිරා- අඤ්ඤෙ වාපිච ඤාතකා
සම්මාපණිහිතං චිත්තං - සෙය්‍යසො නං තතො කරෙ.

(ධ.ප.43)

**සංකේත නිරූපණය.**

අ.නි. : අංගුත්තර නිකාය.
දී.නි.: දීඝ නිකාය.
ධ.ප.: ධම්ම පදය.
ස.නි.: සංයුක්ත නිකාය.
සු.නි.: සුත්ත නිපාතය



18619